17

# මිනිස් වර්ගයාගේ ඒකත්වය

මානව වර්ගයාගේ ආරම්භය හා විකාශය **පිළිබඳ විවිධ මත** හා ආගමික පුරාවෘත්ත රාශියක් මේ වන විට ගොඩ නැගී ඇත. ඒ සියල්ල පාහේ **නිර්මාණවාදී** දේව සංකල්ප හා බැඳී පවතින බව නොරහසකි.

බුදුරජාණන් වහන්සේ මිනිස් වර්ගයාගේ සම්භවය හා විකාශය පිළිබඳ ව සහේතුක ව කරුණු පෙන්වා දෙමින් මිනිසාගේ ඒකත්වය තහවුරු කොට ඇත. එයට අදාළ බුද්ධ දේශනා සමාලෝචනය කළ විට පහත සඳහන් කරුණු ගෙන හැර දැක්විය හැකි ය.


## ජීවවිද්‍යාත්මක සාධක

මිනිස් සංහතිය යම් දිනෙක ආරම්භ වූයේ ද එ ද සිට ම ඔවුන් එක ම වර්ගයක් බව විද්‍යාත්මක පිළිගැනීම යි. බුදුරජාණන් වහන්සේ **භාරද්වාජ හා වාසෙට්ඨ** යන බමුණන් දෙදෙනාට දේශනා කොට ඇත්තේ ද එම සත්‍යය යි. වෘක්ෂලතාවන් අතර කොස්, දෙල්, පොල් ආදි වශයෙන් ප්‍රභේද ඇත. පක්ෂීන් අතර ගිරවා, මයිනා, කපුටා වශයෙන් ප්‍රභේද ඇත. සිවුපාවුන් ගත්විට මුවා, ගෝනා, කොටියා යනා දි වෙනස්කම් තිබේ.

එමෙන් ම මත්ස්‍යයින් හා උරගයින් අතර ද විවිධ වෙනස්කම් දැකිය හැකි ය. එහෙත් මිනිසුන් අතර එ වැනි භේදයක් දැකිය නොහැකි ය. ලොව ඇත්තේ එක ම මිනිස් ජාතියකි. ජීව විද්‍යාත්මක ව බෙද දක්වන්නේ නම් ඒ ස්ත්‍රී පුරුෂ යනුවෙනි. එහෙත් එය ලිංග භේදයක් මිස ජාති හෝ කුල භේදයක් නොවන බව වාසෙට්ඨ සූත්‍රයෙන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්හ. මිනිසාගේ ජාති භේදයක් දක්වීමට උත්සාහ කිරීම මුළාවක් බව මෙයින් පෙනේ.

## ඓතිහාසික සාධක

මානව සමාජයේ ඒකත්වය පිළිබඳ ඓතිහාසික කරුණු සාකච්ඡා කරන සූත්‍රයකි, දීඝ නිකායේ **අග්ගඤ්ඤ** සූත්‍රය. මෙයට අනුව සුපරිසුද්ධ වූ ඓතිහාසික සාධක කිසි ම ජාතියක් සතුව නැත. සෑම ජාතියකින් ම භින්න වූ උපජාතීන් ලෝකයේ කොතෙකුත් ඇත. එසේ ම එහි දැක්වෙන්නේ සංවට්ටමාන කල්පය ක්‍රමයෙන් නැවත ඇති වන බව යි. මෙම අවධියේ සිටින මිනිසුන් තුළ කිසිදු අයුරක භේදයක් නොවී ය. ඔවුන් අතර පෞද්ගලික අයිතිවාසිකම් පිළිබඳ ගැටලු ද නොවී ය.



එනමුදු පෞද්ගලික දේපොළ අයිතිය ඔවුන් අතර ඇතිවීමත් සමග ම සමාජයේ වැරදි ක්‍රියා ව්‍යාප්ත විණි. මෙම තත්ත්වයට මුහුණ දීමට සූදානම් වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජය තුළ වර්ණ හතරක් ඇති වූ ආකාරය බුදුදහම පෙන්වා දෙයි. එහි දී වැරදි ක්‍රියා මැඩලීම පිණිස පාලන බලයට පත් කරන ලද පිරිස ක්ෂත්‍රියයන් වශයෙන් ද වැරදි කළ සමාජයෙන් ඉවත් වී පාපකාරී ක්‍රියාවන්ගෙන් වෙන් වී සිටි පිරිස බ්‍රාහ්මණ යනුවෙන් ද හඳුන්වන ලදී. මේ අතර කෘෂි කර්මාන්තය ආදී කොට ඇති විවිධ කර්මාන්තවල නියැලෙමින් සිටි පිරිස වෛශ්‍ය නම් වූ අතර ලාමක වූ විවිධ ක්‍රියාවන් කරමින් සිටි පිරිස ශූද්‍ර යනුවෙන් හඳුන්වා ඇත. එසේ බෙදී ගියේ සමාජයේ ඓතිහාසික පරිණාමයේ ප්‍රතිඵලයක් වශයෙනි. කිසියම් දෙවියකුගේ මැවීම අනුව නො වේ. ඔවුන්ට ආවේණික වූ සුවිශේෂ ලක්ෂණ නිසා ද නො වේ. මෙයින් ද මිනිසාගේ ඒකත්වය සනාථ වන බව පැහැදිලි ය.

## සමාජවිද්‍යාත්මක සාධක

වර්ණ භේද හෝ ජාති භේද හෝ මිනිසුන් අතර නොපවතින බවට සමාජ විද්‍යාත්මක සාධක රාශියක් බුදුදහම අනුව ඉදිරිපත් කළ හැකි ය. සමාජ යථාර්ථය අනුව **කාකවලිය** නැමැති දිළිඳු කාන්තාව පසු ව සිටුවරියක් වූවා ය. එය සමාජ යථාර්ථයයි. ඇතැම් විට සමාජ ජීවිතයේ දී කෙනකු ලබන තත්ත්වය නිගමනය කරන වැදගත් ම සාධකය වන්නේ ධනයයි. විශාල ධනයක් රැස් කර ගත් විට පුද්ගලයකුට කුලයෙන් පහත් වුවත් උසස් යැයි සම්මත කුල අබිබවා නැගී සිටිය හැකි ය. **මාහාකච්චායන හිමියන්** මධුර රජතුමාට විස්තර කර දෙන්නේ සතර කුලයෙන් කවරකු හෝ අධික ධනයක් රැස්කර ගන්නේ නම් අනෙක් කුල තුන ම ඔහු යටතට ගත හැකි බවයි. ඒ අනුව ස්වාමියා සේවකයා වීමට ද සේවකයා ස්වාමියා වීමට ද හැකි ය. රටක යුද්ධයක් ඇති වූ විට සෙබලුන් වශයෙන් විවිධ කුලවල අය බඳවා ගැනේ. එවැනි අවස්ථාවල සියල්ලෝ සාමූහික ව සටන් කරති. එකට ආහාර ගනිති. සම අසුනේ හිඳිති. හිත මිත්‍ර වදනින් කථා කරති. එහි දී සමානාත්මතාව ප්‍රමුඛස්ථානයට පත් වෙයි. මෙවන් අවස්ථාවක පන්ති භේදයක් හෝ ජාති භේදයක් නොපැනෙන අතර මිනිසාගේ සමානත්වය ඉතා මැනවින් ප්‍රකට වෙයි.

## ආචාරවිද්‍යාත්මක සාධක

කුල හෝ පන්ති භේදයකින් තොරව සෑම මිනිසකුට ම විමුක්තිය ලැබීමේ හැකියාව ඇතැ යි බුදුදහම උගන්වයි. මේ නිසා මිනිස් සමාජයේ ඒකීයත්වය පිළිබඳ ව ඉදිරිපත් කරන සාධක අතර ආචාර විද්‍යාත්මක සාධකය ද අතිශය වැදගත් වෙයි. එසේ ම කුසලාකුසල කර්ම විපාක දීමේ දී ද කුලය හෝ වංශය අදාළ නොවන බව බෞද්ධ සූත්‍ර ධර්මයන්හි විස්තර වන කරුණකි. ඒ අනුව බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන කුමන කුලයක සිටියත් අකුසල කර්ම කළේ නම් දුක් විපාක විඳීමට සිදු වේ. කුසල කර්ම කළේ නම් සැප විපාක ලැබේ.

ජාතිය, ශරීර වර්ණය වැනි පටු සාධක මත බුදුදහම සමාජය බෙද නො දක්වයි. ආචාර ධර්ම අනුව සිදු වන ආධ්‍යාත්මික සංවර්ධනයේ ප්‍රමාණය පදනම් කර ගෙන කිසියම් බෙදීමක් කළ හැකි බව සුප්‍රසිද්ධ දේශනාවක් වන වසල සූත්‍රයෙන් පැහැදිලි කෙරේ. ඒ අනුව කෙනකු උසස් හෝ පහත් අයකු වන්නේ උපතින් නොව ඔහු කරන ක්‍රියාව අනුව බව පැහැදිලි කෙරේ. ධර්මයට අනුව පුද්ගලයා සසර බැඳ තබන කෙලෙස් ධර්මවලින් මිදීම ද අපවිත්‍ර නොවූ සිතින් ඉවසීම, ක්‍රෝධ නොකිරීම, පිළිවෙත් පුරමින් සිල්වත් වීම ආදී දේ නිසා උසස් පුද්ගලයකු වන බව පැහැදිලි වෙයි.

## මනෝවිද්‍යාත්මක සාධක

ලෝකයේ පුහුදුන් සියලු මිනිස්සු රාග දෝස මෝහ යන අකුසල මූලයන්ගෙන් යුක්ත වෙති. එහි දී බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යනුවෙන් හෝ ජාති, ආගම්, කුල, ගෝත්‍ර වශයෙන් හෝ කිසිදු බෙදීමක් කළ නොහැකි ය. එසේ ම එම කෙලෙස් මුල් නැති කිරීමේ හැකියාව සෑම කෙනකු සතුව ම ඇත. ඒ සඳහා අධිෂ්ඨානය, වීර්යය හා කැපවීම ද ඇතිව ආර්ය මාර්ගයේ ගමන් කිරීම පමණක් කළ යුතුව ඇත. විමුක්තිය ලැබීමට ජාති, කුල, ආගම්, වර්ණ ආදී වශයෙන් දක්වෙන කිසිදු සමාජ බෙදීමක් අදාළ නො වන බව බුදුදහම අවධාරණය කරයි. බුද්ධ කාලීන පහත් ය යි සම්මත වූ සුනීත, සෝපාක වැනි අය ද නිවන් පසක් කර ගැනීමෙන් එය පැහැදිලි වේ. ඒ අනුව රාගා දී කෙලෙස් නැති කර නිවන් පසක් කර ගැනීමට ද කුලය බල නොපා යි. චිත්ත පාරිශුද්ධිය ම ඒ සඳහා උපකාරී වෙයි. එම හැකියාව ද සියලු මිනිසුන්ට ඇති බව බුදුදහම උගන්වයි.

ඉහත දක්වන ලද කරුණු අනුව සමාජය වර්ගීකරණය කිරීමේ යුක්තියක් නො පෙනෙන නමුදු කාලගුණික හා පාරිසරික සාධකවලට අනුව මිනිසුන්ගේ ශරීර වර්ණයේ කිසියම් වෙනසක් ඇති විය හැකි ය. එ පමණක් නොව ඔවුන් අඳින ඇඳුම්වලින් ද පළඳින ආභරණවලින් ද විවිධත්වයක් ඇති විය හැකි ය. ඔවුන් ගන්නා ආහාර, ආගමික විශ්වාස බෙහෝ වෙනස්කම් පෙන්නුම් කරයි. මේ අතර සාමාජික හර පද්ධතීන්ගෙන් ද ව්‍යවහාර කරන භාෂාව හෝ පොදුවේ ගත් කල සංස්කෘතිකමය වශයෙන් ද විශ්ව සමාජයේ යම් යම් වෙනස්කම් විද්‍යමාන වේ.

එහෙත් මානව වර්ගයා එක ම සමාජ සංස්ථාවකි. බුදුදහම අවධාරණය කරන්නේ මිනිසා යනු ජාති කුල ගෝත්‍ර වර්ණ වශයෙන් බෙදා වෙන් කළ නො හැකි විවිධත්වයක් නො දක්වන සත්ත්ව කොට්ඨාසයක් බව ය. මෙම සංකල්පය මත පිහිටා කටයුතු කිරීමට මිනිසාට යම් දිනක හැකි වෙයි ද එදිනට මුළු මහත් විශ්වය තුළ ම සාමය සමගිය හා සහජීවනය ගොඩනැගී එක ම මිනිස් පවුලක් ලෙස කටයුතු කළ හැකි වනු නො අනුමානයි.

## සාරාංශය

ජාතිය, කුලය, ගෝත්‍රය, භාෂාව, ආගම, ශරීර වර්ණය ආදී විවිධ සාධක අනුව මිනිසුන් වර්ග කිරීම ලෝකයේ බොහෝ සමාජවල දක්නට ඇත. බුද්ධ කාලීන වෛදික, බ්‍රාහ්මණ සමාජ ක්‍රමය සකස් ව පැවතියේ චතුර්වර්ණ පිළිබඳ ඉගැන්වීම මුල් කොට ගෙන යි. ඒ අනුව සමාජයේ ඇතැම් වර්ණ හෙවත් කුලවල ජනයා උසස් යයි ද ඇතැමුන් පහත් යැයි ද සැලකිණ. එසේ ම උසස් යැයි සම්මත වූවන්ට වැඩි සමාජ වරප්‍රසාද ලැබුණු අතර, පහත් යයි සම්මත වූවන්ට අඩු වර ප්‍රසාද හිමි විය. බුදුදහම කවර අයුරකින් වුවත් එබඳු සමාජ වර්ගීකරණයන්ට හෝ වරප්‍රසාද පිළිබඳ වෙනස්කම්වලට එකඟ නො වේ. සමානාත්මතාව අගයන බුදුරජාණන් වහන්සේගේ විවිධ දේශනා තුළින් මතුකර ගත හැකි ජීව විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක, ඓතිහාසික ආචාර විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක සාධක අනුව එම කරුණු මැනවින් තහවුරු වෙයි.

## ක්‍රියාකාරකම්

01. සමාජ වර්ගීකරණය තුළින් ඇතිවන විවිධ ගැටලු පෙන්වා දෙන්න.

02. සමානාත්මතාව සමාජයක සාමය හා සංවර්ධනය සඳහා උපකාරී වන අයුරු පැහැදිලි කරන්න.

03. ''කම්මනා වසලෝ හෝති කම්මනා හොති බ්‍රාහ්මණෝ'' යන බුද්ධ වචනය ඇගයුමට ලක් කරන්න.

## පැවරුම

01. ''මුළුලොව මිනිසුන් එක ම පවුලකි'' යන තේමාව යටතේ පද්‍ය පන්තියක් හෝ රචනයක් හෝ නිර්මාණය කරන්න.

කුලේ ඇති — මහතය
කැලේ යන බව — නියතය
බලේ හොඳ — සිරිතය
දිලේ සඳ ලෙස දෙලොව — සැපතය

සිරිත් මල්දම